සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය | පැය 02 |
| கண்டுபிடிப்பு சோதனை 02 மணி நேரம் | 02 மணி ர |
| Diagnostic Test | 02 Hour |

| | |
|---|---|
| ඉතිහාසය I, II | 06ශ්‍රේණිය |
| வரலாறு | தரம் 06 |
| History | Grade 06 |

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගිනි)
- අංක 01 සිට 05 දක්වා වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) ඉතිහාසය යනුවෙන් අදහස් කරන්නේ,
   I. වර්තමාන සමාජය පමණි
   II. අනාගත පිළිබඳ අනාවැකි කීමයි
   III. අතීත කාලයේ ජීවත් වූ මිනිසුන් ගැන සොයාබැලීමයි
   IV. පෞද්ගලික තොරතුරු සොයා බැලීමයි

2) මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිත කිරීම පෙන්නුම් කරන සාක්ෂි සොයා ගෙන ඇත්තේ,
   I. ස්පාඤ්ඤයෙනි II.ඊශ්‍රායලයෙනි III. චීනයෙනි IV. ඉන්දියාවෙනි.

3) මෙසපොතේමියානු සමාජය බෙදී තිබුණු කොටස් ගණන වන්නේ,
   I. දෙකකි. II.තුනකි III. හතරකි IV. පහකි

4) අතීත මානවයන් ගුරුගල් භාවිත කළේ කුමන කාර්යයන් සඳහා ද?
   I. යාත්‍රා තැනීමට ය.
   II. වර්ණ තැනීමට ය
   III. පුස්කොළ පොත් තැනීමට ය
   IV. ගොඩනැගිලි තැනීමට ය

5) විජය කුමරුගේ පැමිණීම පිළිබඳ පුරාවෘත්තය සඳහන් ඓතිහාසික මූලාශ්‍රය වන්නේ,
   I. දීපවංශය යි II.පූජාවලිය යි III. මහාවංශය යි IV. රාජාවලිය යි

❖ අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රකාශ හරි නම් ✓ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වරහන් තුළ යොදන්න

6) දීපවංශය රචනා කළේ මහා විහාර වාසී මහානාම හිමියන් ය (.........)
7) ඩොලවීර හා කාලිබන්ගන් යනු ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් නගර දෙකකි. (.........)
8) ඉන්දියාවේ ගෞතමීපුත්‍ර සාතකර්ණී රජු ශක වර්ෂ ක්‍රමය ආරම්භ කළේ ය. (.........)
9) මහාවංශයේ සඳහන් පරිදි විජය ඇතුළු පිරිස ගොඩබසින ලද තැන පිහිටියේ ශ්‍රී ලංකාවේ බටහිර මුහුදු වෙරළේ ය. (.........)
10) ස්වභාව ධර්මය දෙවියන් ලෙස සලකා වැඳුම්-පිදුම් කළේ ඊජිප්තු ශිෂ්ටාචාරයේ වැසියන් ය (.........)

❖ ප්‍රශ්න අංක 11 සට 15 දක්වා වගන්ති වල හිස්තැනට අදාළ පිළිතුර පහත දී ඇති වචන වලින් තෝරා ලියන්න

11) ගල් මෙවලම් වලට අමතරව ගල් යුගයේ මිනිසුන් ............................. සෑදූ උපකරණ භාවිත කර ඇත.

12) පළමුවරට රබර් බෝලය සාදන ලද්දේ ............................... වැසියන් ය

13) වානර පරම්පරාවට අයත් චිම්පන්සියකුගෙන් මානවයකු බිහිවීමේ ක්‍රියාවලිය ................ ලෙස හැඳින්වේ.

14) ඉතිහාසයේ සඳහන් පරිදි විජය කුමරු සමග පැමිණි පිරිස ගම්මාන ඇති කළ බව සඳහන් වන්නේ ..................................... ආශ්‍රිත ප්‍රදේශයේ ය.

15) ලෝකයේ පැරණිතම අක්ෂර පද්ධතිය නිපදවන ලද්දේ ................... ශිෂ්ටාචාරයේ වැසියන් ය.

(මල්වතු ඔය/ මානව පරිණාමය/ මායා ශිෂ්ටාචාරයේ / මෙසපොතේමියානු / ඇටකටු වලින් හා ලී වලින්)

❖ අංක 16 සිට 20 දක්වා "අ" තීරුවට ගැළපෙන යෙදුම "ආ" තීරුවෙන් තෝරා යා කරන්න.

| අ | ආ |
|---|---|
| 16) පෘථිවිය බිහිවීම | ඔස්ට්‍රලෝපිතිකස් |
| 17) පළමුවරට ගින්දර සොයාගත් මානවයා | ක්‍රි:පූ: 544 |
| 18) ලෝකයේ මුලින් ම ජීවීන් බිහිවීම | හෝමෝ ඉරෙක්ටස් |
| 19) විජය කුමරු ලංකාවට පැමිණියේ | ජලය |
| 20) මිනිසකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා | දූවිලි වලාව |

# <u>දෙවන කොටස</u>

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්යවේ.
- ❖ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1) පහත දැක්වෙන පින්තූරය අධ්‍යනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



I. ඉහත පින්තූරයෙන් දැක්වෙන මූර්තිය අයත් ශිෂ්ටාචාරය කුමක්ද?
II. එම මූර්තිය අයත් ශිෂ්ටාචාරය දියුණු වූයේ කුමන ගංගා නිම්නයේ ද?
III. මෙම ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගර දෙකක් සඳහන් කරන්න.
IV. ඉහත මූර්තියෙන් පිළිබිඹු වන්නේ කවරක් ද?
V. ඔහු එසේ හැඳින්වීමට ඉදිරිපත් කර ඇති හේතු මොනවාද? (ලකුණු 20යි)

2) .

I. ඉතිහාසය ඉගෙනීමට ප්‍රයෝජනවත් වන මූලාශ්‍ර වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02යි)
II. ඔබේ පාසලේ ඉතිහාසය දැන ගැනීමට උපකාරී වන මූලාශ්‍ර 03ක් ලියන්න (ලකුණු 03යි)
III. ඉතිහාසයේ විවිධ සිදුවීම් අයත් කාලය මැනීමට භාවිත වන ක්‍රම 05ක් නම් කරන්න (ලකුණු 05යි)

3) .

I. මිනිසාගේ සංස්කෘතික දියුණුව බෙදිය හැකි ප්‍රධාන අවධි තුන නම් කරන්න (ලකුණු 03යි)
II. පුරාශිලා යුගයේ දී මිනිසුන් ආහාර පාන සපයා ගත්තේ කෙසේ ද? (ලකුණු 02යි)
III. (අ) එම යුගයේ ජනයා තමන්ගේ මියගිය ඥාතීන්ට ගෞරවය පුද කළේ කෙසේද?
(ආ) පුරාශිලා යුගයේ මානවයා දියුණු කරගත් හැකියාවන් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 05යි)

4) .

I. ශිෂ්ටාචාරයක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02යි)
II. ශිෂ්ටාචාරයක් යනු කුමක්දැයි හඳුනාගැනීමට ඉවහල් කරගත හැකි මූලික ලක්ෂණ 3ක්ලියන්න (ලකුණු 03යි)
III. ශිෂ්ටාචාරය පිළිබඳව ඉගෙනීම අපට වැදගත් වන්නේ මන්දැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න (ලකුණු 05යි)

5) .

I. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය දියුණු වූයේ කුමන ගංගා නිම්න ආශ්‍රිතව ද?

II. එම ශිෂ්ටාචාරයේ පූජාවට ලක් වූ දෙවියන් නම් කරන්න (ලකුණු 03යි)

III. (අ) මෙසපොතේමියානු සමාජය බෙදී තිබූ කොටස් 04 නම් කරන්න.

(ආ) මෙසපොතේමියාවේ උතරු කොටසේ ජීවත් වූ ඇසිරියන්වරුන්ගේ ප්‍රධාන රැකියාව කුමක්ද?

(ලකුණු 05යි)

6) .

I. ජනාවාස වීම යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 02යි)

II. මහාවංශයට අනුව ශ්‍රී ලංකාව ජනාවාස වී ඇත්තේ කවර කාලයක කවර ආකාරයෙන් ද? (ලකුණු 03යි)

III. (අ) ශ්‍රී ලංකාවේ ආදී මානවයින් වාසය කළ බවට සොයාගෙන ඇති ස්ථාන 2ක් නම් කරන්න

(ආ) ඔවුන් එදිනෙදා කටයුතු සඳහා භාවිත කළ උපකරණ වර්ග 3ක් ලියන්න

(ලකුණු 05යි)